**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ**.**

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත**.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉතිරි කිරීමේ තැන්පතු ගිණුමට අදාළ රු.57,013 ක පොලී සමාලෝචිත වර්ෂයේ අවසාන දින ලැබී තිබියදීත්, ලැබිය යුතු පොලි මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | මෙම පොලී මුදල හඳුනාගත නොහැකි වූ අතර, ලදුපත 2024 ජනවාරි මස නිකුත් කර ඇති බැවින්, ණයගැති කළ බව | ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.186,249 ක වත්කම් විෂයයන් 05 ක හා එකතුව රු.333,828 ක බැරකම් විෂයයන් 04 ක උපලේඛන, ලිපිගොනු හා ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මෙම ගිණුම් විෂයයන්වලට අදාළ උපලේඛන හා ලේඛන පසුගිය වර්ෂවල ගිණුමේ පොත්වල ද සොයාගත නොහැකි වූ අතර, විධිමත් පරිදි විෂයයන් මාරු නොවීම හේතුවෙන් මෙම ගැටළුව මතුව ඇති බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය උපලේඛන නිවැරදිව පවත්වා ගෙන යා යුතුය |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (අ) | 128 වගන්තිය | සභාව විසින් පොදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන රු.52,710,635 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 56 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි සඳහන් ඉඩම් හා ගොඩනැගිලි ඉදිරියේ දී පවරා ගැනීමට කටයුතු කරන බව | ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | 149 වගන්තිය | සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින් පසුගිය වර්ෂයේ ලැබීම්වලින් සියයට 01 ක ආදායම ලබා ගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ දී සියයට 01 ආදායම අය කර ගන්නා බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | 2023 නොවැම්බර් 02 දිනැති අංක FC/PDP/01/01/2023-II දරන මුදල් කොමිෂන් සභා ලේකම්ගේ ලිපිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය | විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සභා අරමුදලින් රු.228,150 ක් වැය කර ද්‍රව්‍යාධාර බෙදා දී තිබුණි. | වැඩසටහන සඳහා සෘජු ශීර්ෂ වෙන් කිරිමක් පැවති බැවින් මිල ගණන් කැඳවා ඉහත වියදම් දරා වැඩසටහන සංවිධානය කළ බව | චක්‍රලේඛ හා පනතේ විධිවිධාන අනුව අනුමැතිය ලබා ගෙන කාර්යයන් සිදු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,356,264 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,076,675 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,610,000 | 6,111,765 | 5,622,187 | 6,534,288 | 5,540,000 | 5,364,782 | 4,654,563 | 6,044,710 |
| (ii) | කුලී | 3,313,475 | 680,565 | 683,391 | 128,557 | 3,313,475 | 1,830,956 | 2,006,906 | 131,383 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,082,000 | 777,850 | 768,350 | 9,500 | 885,850 | 832,410 | 749,260 | 83,150 |
| (iv) | වෙනත් ආදායම් | 39,773,000 | 36,110,421 | 30,459,593 | 27,740,611 | 22,742,000 | 30,120,325 | 30,902,650 | 22,089,783 |
| | එකතුව | 50,778,475 | 43,680,601 | 37,533,521 | 34,412,956 | 33,486,325 | 38,148,473 | 38,313,379 | 28,349,026 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 43 ක ආදායමක් බිල් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාළව හිඟ ලැබීම් ද සමඟ රුපියල් මිලියන 38 ක් රැස් කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 28 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට රුපියල් මිලියන 34 ක් දක්වා වැඩි වී තිබුණි. | අදහස් දක්වා නොමැත | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **වරිපනම්** | | |
| | වරිපනම් ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වරිපනම් දේපළ 18 කින් අය විය යුතු එකතුව රු.119,777 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම හිඟ වරිපනම් අය කිරීමට ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ වරිපනම් අය කර ගත යුතුය |
| (ඇ) | **ජල ගාස්තු** | | |
| | ප්‍රාදේශීය සභාවේ ජල ව්‍යාපෘති 19 ක වසර 03 කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු රු.2,258,646 ක ලැබිය යුතු ජල ගාස්තු අය කර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |
| (ඈ) | **අක්කර බදු** | | |
| | ඒකක හිඟය රු.1,000 ට වැඩි අක්කර බදු අය කරනු ලබන දේපළ 31 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.52,106 ක මුදලක් අය කර නොතිබුණි. | ඉතිරි මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ අක්කර බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

(ඉ) **දැන්වීම් පුවරු ගාස්තු**

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 25 කට අදාළව වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින රු.290,091 ක් අය කර ගෙන නොතිබුණි. | වාචිකව මෙන්ම, ලිඛිතව ද දැනුවත් කිරීම් කර ඇති බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |

(ඊ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.26,198,100 ක් හා උසාවි දඩ රු.1,542,511 ක් විය. | මුද්දර ගාස්තු හිඟ මුදල් හා උසාවි දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ජල ව්‍යාපෘති 19 ක ජල පාරිභෝගිකයින් 4,100 ක් සඳහා පානීය ජලය පිරිපහදු කිරීමකින් තොරව බෙදා හැර තිබුණු අතර, ජල සාම්පල් පරීක්ෂා කිරීමක් ද සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයේ ජල සාම්පල් පරීක්ෂා කිරීම සිදු කරන බව | ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, බල ප්‍රදේශයේ නිවාසවල මළ ඉවත් කිරීම හා ප්‍රවාහනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව දක්වා තිබුණ ද, මළ ඉවත් කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් හා ඊට අදාළ ගලි රථ සේවාව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ගලි බවුසරයක අවශ්‍යතාවය සඳහන් කර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව | බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පවත්වා ගෙන යාම වෙනුවෙන් පනතේ කාර්යයන් ඉටු කළ යුතුය |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 119 ප්‍රකාරව, පදිංචිකරුවන්ගේ අවශ්‍යතාවය සඳහා පොදු වෙළඳ පොළවල් හෝ සති පොළවල් ආරම්භ කර ක්‍රියාත්මක කර නොතිබුණි. | සතිපොළක් පැවැත්වීමට සභාව උත්සාහ දරා ඇති බව | සති පොළක් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ගලබොඩ දිය ඇල්ල සංචාරක කලාපයේ ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් රු.1,033,400 ක ආදායමක් උපයා තිබුණ ද, ඒ වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ අතුරු ව්‍යවස්ථාව සකස් කර ගැනීමට කටයුතු කරන බව | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 01 හා 02 දින සභාවේ නිලධාරීන් 27 ක් තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාවේ කසළ අංගනය නිරීක්ෂණය කිරීමේ චාරිකාවක් සඳහා සහභාගී වීම වෙනුවෙන් රු.281,255 ක් වැය කර තිබුණ ද, සභාවේ කසළ කළමනාකරණ ඒකකය ස්ථාපිත නොකර දෛනිකව එකතු වන කසළ නාවලපිටිය නගර සභාවේ කසළ අංගනයට බැහැර කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. ඒ අනුව, නිරීක්ෂණ චාරිකාව සඳහා වැය කළ රු.281,255 ක මුදල නිෂ්කාර්යය වී තිබුණි. | කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත්වීම අත්‍යවශ්‍ය කාරණයක් බැවින්, සභා අරමුදලින් වියදම් දැරීම සිදු කළ බව | නිරීක්ෂණ චාරිකාවේ අත්දැකීම් ක්‍රියාත්මක කළ යුතුය |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බැකෝ යන්ත්‍රයකට සිදු වූ අලාභ හානියක් සම්බන්ධව රු.173,747 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට තීරණය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට ඉන් රු.113,744 ක් අය කර ගෙන නොතිබුණි. | මූලික වාරික 02 ක් මාසික දීමනාවෙන් අය කර ඇති අතර, ඉතිරි වාරික 08 ද මාසික දීමනාවෙන් අය කරන බව | අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සභාවට අයත් ජල ව්‍යාපෘති 06 ක ජල පාරිභෝගිකයින් 587 කගෙන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අය කළ යුතු ජල සම්බන්ධතා ගාස්තු එකතුව රු.3,579,406 ක් අය කර නොතිබුණි. | හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ගාස්තු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැතියන් රු.25,366,398 ක් වසර 01 ත් 05 ත් අතර කාලයක සිට අය කර නොතිබුණි. | හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ අය කර ගත යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව 33,657,568 ක් විය. ඉන් වසර 01 ත් 05 ත් අතර කාල පරාසයකට අදාළ ශේෂය රු.24,962,545 ක් හා වසර 05 ට වැඩි ශේෂය රු.616,594 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ ගෙවීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | 2014 වර්ෂයේ පුර නැඟුම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත රු.1,500,000 කට ඉදිකළ බලංතොට උතුර ප්‍රජාශාලාව ඉදිකළ ඉඩම් පවරා නොගැනීම යනුවෙන් දක්වා කොන්ත්‍රාත්කරුට අදාළ මුදල් ගෙවා නොතිබුණු අතර, කොන්ත්‍රාත්කරු විසින් දිගින් දිගට මුදල් ඉල්ලීම් කර තිබිය දී, ණයගැති හා ණයහිමි කර තිබුණු මෙම මුදල ගිණුම්වලින් කපා හැර තිබුණි. | 2024 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ණයගැති හා ණයහිමි කපා හැරීම නිවැරදි කළ යුතුය |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව ආයතන 03 කින් මුහුණු 05 ක් සහිත පිත්තල දේව රූපයක් මිලදී ගැනීම සඳහා ලබා ගත් අත් මිල ගණන් පදනම්ව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණ ආයතනයකින් අඩි 1 ½ ක් උසැති මුහුණු 05 ක් සහිත පිත්තල දේව රූපයක් ලබා ගැනීමට අනුමත කර ගෙන එක් මුහුණක් ඇති පිත්තල දේව ප්‍රතිමාවක් ලබා ගෙන සැපයුම්කාර ආයතනය වෙත රු.350,000 ක් ගෙවා තිබුණි. | දේව ප්‍රතිමා ඉන්දියාවෙන් ආනයනය කරන ආයතනයකින් අත් මිල ගණන් ලබා ගත් අතර, දේව ප්‍රතිමාව සපයන ආයතනය අප වෙත එම ප්‍රතිමාව සැපයීමට ප්‍රථම ගෙවීම් කරන ලෙස දන්වා ඇති බැවින්, ගෙවීම් කර ඇති බව | රීති ප්‍රකාරව කටයුතු කර ඇණවුම් කළ භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේ දි තනතුරු 07 ක පුරප්පාඩු 08 ක් හා එක් තනතුරක අතිරික්ත සේවක සංඛ්‍යාව 08 ක් විය. | නිරන්තර ඉල්ලීම් සිදු කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය |
| **(ආ) සේවක ණය** | | |
| ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් වූ නිලධාරීන් 03 කගේ එකතුව රු.394,585 ක ණය ශේෂ වසර 04 ක කාලයක සිට අය කර නොතිබුණි. | හිඟ මුදල අය කර ගන්නා බව | සභාවට අය කර ගත යුතු සේවක ණය අය කර ගත යුතුය |